බෝග වගාව සඳහා මහඟු සේවයක් කරනු ලබන **පස නිවැරදිව කළමණාකරණය** කිරීම දීර්ඝ කාලයක් අඛණ්ඩව, බෝග වගාවෙන් ආර්ථිකව වාසිදායි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ඉතාම වැදගත් වේ.

වගා කරනු ලබන බෝග සඳහා පොහොර යෙදීමට පෙර පස විශ්ලේෂණය කර ඒ අනුව අවශ්‍ය පෝෂක ප්‍රමාණය පමණක් පසට යෙදීම පස නිවැරදිව කළමණාකරණය කිරීමේ එක් වැදගත් පියවරකි. මේ සඳහා අදාල වගා ක්ෂේත්‍රය නිවැරදිව නියෝජනය වන ආකාරයට පස් සාම්පලයක් ලබාගැනීම පිළිබඳව වඩාත් සැළකිලිමත් විය යුතුයි. පස් සාම්පලයක් විශ්ලේෂණයෙන් ලැබෙන දත්ත වල නිවැරදිභාවය මෙන්ම එම දත්ත වල ප්‍රයෝජනවත්භාවය ද පස් සාම්පලය ලබාගැනිමේ නිවැරදිතාවය මත රඳා පවති. ඒකාකාරි ක්‍රමවත් හෙක්ටාරයක භූමියකින් ස්ථාන 15 හෝ 20 කින් පස් ලබාගත යුතු අතර එම පස් වලින් ග්‍රෑම් 500 හෝ 750 ක් වන සාම්පලයක් විශ්ලේෂණය සඳහා රසායනාගාරයට බාරදෙනු ලබයි.

අවශ්‍යය ද්‍රව්‍යයන්



1. උදැල්ලක් හෝ පාංශු අවගාරයක් (ඕගරයක්)
2. පස් එකතු කිරීම සඳහා පිරිසිදු පොලිසැක් මල්ලක්
3. රසායනාගාරයට යවනු ලබන සාම්පලය සකසා ගැනීමට පිරිසිදු පොලිතීන් කැබැල්ලක් හෝ කොන්ක්‍රීට් හෝ ලී වලින් තැනූ මතුපිටක්
4. රසායනාගාරයට යවනු ලබන සාම්පලය (500g හෝ 750g ක්) බහාලීම සඳහා පිරිසිදු පොලිතීන් කවර දෙකක්
5. පිරිසිදු රෙදි හෝ පොලිතීන් පටියක් නැතහොත් රබර් බෑන්ඩ්, පෑනක්, කාඩ්බෝඩ් කැබැල්ලක්

පස් සාම්පල ලබාගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු

1. හැකි සෑමවිටම කන්න දෙකක් අතරතුර කාලයේ දී පස් සාම්පල ලබාගැනීම.
2. බෝගය ක්ෂේත්‍රයේ පවතින විට පස් සාම්පල ලබාගැනීමට සිදුවුවහොත් පොහොර යෙදීමට පෙර පේළි දෙකක් අතුරින් සාම්පල ලබාගැනීමට කටයුතු කිරීම.
3. ඒකාකාරි (තැනිතලා, අස්වනු සමාන හෝ ඒකාකාරිව කළමනාකරණය කරන ලද) ක්ෂේත්‍රයක් තනි ඒකකයක් ලෙස සලකා සාම්පල කිරීම.
4. පාංශු වර්ණය, බෑවුම, ජලවහනය හෝ බෝග රටාවන් සහ පොහොර යෙදීම් වැනි පාංශු කළමනාකරණ කටයුතු වෙනස් වන පස් සඳහා වෙන් වශයෙන් සාම්පල ලබාගැනීම.
5. පොහොර ගොඩගසා තිබුන ස්ථාන, සත්ත්ව අපද්‍රව්‍ය (ගොම, එළු පොහොර වැනි) පවතින ස්ථාන, කසල එකතු කර තිබූ ස්ථාන වතුර ඇල මාර්ග හා පාරවල් අද්දරින් හැකිතාක් දුරට සාම්පල ලබාගැනීමෙන් වැළකීම.
6. ක්ෂේත්‍රයේ ස්වභාවය පිළිබඳව මනා අවබෝධයක් තිබෙන වගා කටයුතු හා සම්බන්ධව කටයුතු කරනු ලබන පුද්ගලයාව හැකි සැමවිටම සාම්පල ලබාගැනීමේ දී සහභාගී කරවා ගැනීම.
7. පොහොර අඩංගුව තිබූ ඇසුරුම්, භාජන සහ උපකරණ කිසිවිටකත් පස් සාම්පල ලබාගැනීමේ දී භාවිතයට නොගැනීම.
8. පස් සාම්පලය ඇසුරුම් කිරීමට රෙදි හෝ කඩදාසි කවර භාවිතා නොකිරීම.
9. සාම්පලය සකස් කරගත් වහාම එය හඳුනා ගැනීම සඳහා අංකනය කිරීම.

පස් සාම්පල ලබාගැනිම සහ රසායනාගාරයට බාරදීම සඳහා පිළියෙල කිරීම

1. ක්ෂේත්‍රයෙන් සාම්පල ලබාගන්නා ස්ථාන හඳුනා ගැනීමට ඒකාකාරි ක්‍රමවත් හෙක්ටාරයක භූමියකින් ස්ථාන 15 හෝ 20 කින් පස් ලබාගනි.

මේ සඳහා පහත ක්‍රම අනුගමනය කළ හැකිය



2. නිශ්චය කරගත් ස්ථානවල පවතින මතුපිට ආස්තරණය, (වල්පැළ, කාබනික ද්‍රව්‍යයන් සහ ගල් කැට බොරළු කැට) සූරා ඉවත් කිරීම.
3. උදැල්ල හෝ ඕගරයක් භාවිතා කරමින් මතුපිට සිට අඟල් 6 හෝ 15cm දක්වා ගැඹුරට අඟල් 1 හෝ 2.5cm තීරුවක් ලෙස (රූපයේ පරිදි) අවශ්‍යය පස් සාම්පලය ලබාගැනීම.



4. මෙසේ ලබාගත් පස් පිරිසිදු මතුපිටක අතුරන්න. ගල් කැට, බොරළු, ශාක මුල් සහ වෙනත් අපද්‍රව්‍යයන් ඉවත් කරගන්න.
5. එය රසායනාගාරට යැවීම සඳහා ග්‍රෑම් 500 - 750 ක් දක්වා පහත පියවරයන්ට අනුව කුඩා කරගන්න.
   - සමානව පිරිසිදු මතුපිටෙහි අතුරාගත් සාම්පලය **1 රූපයෙහි** ආකාරයට කොටස් 4කට බෙදාගන්න. සලකුණු කර ඇති පරිදි කොටස් දෙකක් ඉවත් කරන්න.
   - ඉතිරි කොටස් දෙක නැවත හොඳින් මිශ්‍රකර සමානව අතුරන්න.
   - **2 රූපයෙහි** ආකාරයට කොටස් 4කට බෙදාගන්න. සලකුණු කර ඇති පරිදි කොටස් දෙකක් ඉවත් කරන්න.
   - මේ ආකාරයට කිහිප වතාවක් පස් ඉවත් කරමින් ග්‍රෑම් 500-750 ක් පමණ වන සාම්පලයක් තනාගන්න.



- මෙම සාම්පලය (ග්‍රෑම් 500-750) පිරිසිදු පොලිතීන් කවරයකට දමා ගන්න.
- එය පිරිසිදු රෙදි හෝ පොලිතීන් පටියක් නැතහොත් රබර් බෑන්ඩ් එකක් යොදා බැඳ ගන්න.
- කාඩ්බෝඩ් කැබැල්ලක පහත විස්තර සඳහන් කර මෙම පොලිතීන් කවරයෙහි බඳින්න.

වගාකරුගේ නම	-
වගාකරුගේ ලිපිනය	-
වගා වපසරිය	-
දිස්ත්‍රික්කය	-
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	-
ග්‍රාම නිළධාරි වසම	-
සාම්පල් කළ දිනය	-
සාම්පල් අංකය	-
දුරකතන අංකය	-

- මෙම විස්තර ද සහිත සාම්පලය අඩංගු පොලිතීන් කවරය නැවත පිරිසිදු පොලිතීන් කවරයකට දමන්න.
- එම කවරයෙහි ද ඉහත විස්තර සහිත කාඩ්බෝඩ් කැබැල්ලක් බඳින්න.
- මෙසේ සකසා ගත් සාම්පලය එදිනම රසායනාගාරයට බාරදීමට නොහැකි නම් පිටතින් මෙම සාම්පලයට කිසිදු ද්‍රව්‍යයක් ඇතුල් නොවන පරිදි ආරක්ෂිත ස්ථානයක ගබඩාකර හැකි ඉක්මනට විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරයට බාර දෙන්න

තාක්ෂණික උපදෙස්

එන්. රේණුකා සිල්වා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)

සුදර්ශනී පෙරේරා - වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව

දුරකතන අංකය - 0812 388 011- 3

Designed : NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE, Department of Agriculture

නිවැරදිව පස් සාම්පලයක් ලබාගෙන

වගාවට පෙර

පස පරීක්ෂා කරගනිමු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි